**එක්සත් ජාතික පක්ෂය**
ஐக்கிய தேசியக் கட்சி
**United National Party**

# පාස්කු ඉරිදා ප්‍රහාර විමර්ශනය සම්බන්ධයෙන් එක්සත් ජාතික පක්ෂය නිකුත් කළ නිවේදනය

වර්ෂ 2019 අප්‍රේල් 21 වැනි දින සිදු වූ පාස්කු ඉරිදා ප්‍රහාරයෙන් පසුව ශ්‍රී ලංකාවේ විමර්ශන ආයතන සතුව ප්‍රමාණවත් විශේෂඥ දැනුමක් නොතිබූ බැවින් එවකට අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා ප්‍රහාරය සම්බන්ධයෙන් පූර්ණ විමර්ශනයක් පවත්වා වාර්තාවක් ලබා දෙන ලෙස ඇමරිකානු රජයෙන් ඉල්ලා සිටියේය. ඊට ශ්‍රී ලංකා බලධාරීන්ගේ පූර්ණ සහයෝගය ලබා දෙන බවට ද අග්‍රාමාත්‍යවරයා සහතික විය. පසුව, එනම් අප්‍රේල් 22 වැනි දින එවකට අග්‍රාමාත්‍යවරයා සහ ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් මහතා අතර පැවති දුරකථන සංවාදයේදී ද එවැනිම ඉල්ලීමක් කරන ලදී.

රනිල් වික්‍රමසිංහ මහතා සමග කළ දුරකථන සංවාදයෙන් පසුව ඇමරිකානු ජනාධිපතිවරයා පහත ට්විටර් පණිවුඩය තැබීමට පියවර ගනු ලැබීය.


Donald J. Trump
@realDonaldTrump
Follow

Spoke to Prime Minister Ranil Wickremesinghe of Sri Lanka this morning to inform him that the United States stands by him and his country in the fight against terrorism. Also expressed condolences on behalf of myself and the People of the United States!

23:35 · 22 Apr 19

> *“ත්‍රස්තවාදයට එරෙහි සටනේදී එක්සත් ජනපදය ඔහු සහ ඔහුගේ රට සමඟ පෙනී සිටින බව දැනුම් දීම සඳහා අද උදෑසන ශ්‍රී ලංකාවේ අග්‍රාමාත්‍ය රනිල් වික්‍රමසිංහ මහතා සමඟ කතා කළෙමි. එමෙන්ම මා වෙනුවෙන් සහ එක්සත් ජනපද වැසියන් වෙනුවෙන් මගේ බලවත් ශෝකය ද ප්‍රකාශ කළෙමි!”*

රහස් පරීක්ෂණ දෙපාර්තමේන්තුව (CID), හමුදා බුද්ධි අංශ සහ රාජ්‍ය බුද්ධි සේවය ඇතුළු ශ්‍රී ලංකා බලධාරීන් සමඟ ඒකාබද්ධව FBI ආයතනය විසින් ප්‍රහාර පිළිබඳව පූර්ණ විමර්ශනයක් පවත්වන ලදී.

**මධ්‍යම කාර්යාංශය** மத்திய பணியகம் **Central Bureau**
“සිරිකොත මන්දිරය”, 400, කෝට්ටේ පාර, පිටකෝට්ටේ, ශ්‍රී ලංකාව.
“சிரிகொத இல்லம்”, 400 கோட்டே றோட், பிட்டகோட்டே, இலங்கை.
"Sirikottha House", 400, Kotte Road, Pitakotte, Sri Lanka.
Tel: 0112865374 / 0112865375 Fax : 0112865380
E-mail : gnunp@sltnet.lk Web : www.unp.lk



වාර්තා කරන ලද සියලුම තොරතුරු සහ එකතු කරන ලද ද්‍රව්‍ය පදනම් කර ගනිමින්, FBI ආයතනය විසින් ශ්‍රී ලංකා රජයට වාර්තාවක් නිකුත් කළේය. ශ්‍රී ලංකාවේ සියලුම අදාළ බලධාරීහු මෙය පිළිගත්හ.

2020 නොවැම්බර් 12 වැනි දින, FBI හි විශේෂ නියෝජිත මෙරිලී ආර්. ගොඩ්වින් (Merrilee R. Godwin) විසින් කැලිෆෝනියා මධ්‍යම දිස්ත්‍රික්කය සඳහා වන එක්සත් ජනපද දිස්ත්‍රික් උසාවියේ පිටු 71 කින් යුත් දිවුරුම් ප්‍රකාශයක් ගොනු කරන ලදී. වසර දෙකක විමර්ශනයකින් පසුව, එනම් 2020 දෙසැම්බර් 11 වැනි දින ලොස් ඇන්ජලීස්හි එක්සත් ජනපද දිස්ත්‍රික් උසාවියේ අපරාධ නඩුවක් ගොනු කරන ලදී. පැමිණිල්ලේ නම් කර ඇති විත්තිකරුවන් (මොහොමඩ් නවුෆර්, මොහොමඩ් අන්වර් මොහොමඩ් රිස්කාන් සහ අහමඩ් මිල්හාන් හයාතු මොහොමඩ්), ප්‍රහාරයට සම්බන්ධ අනෙකුත් සැකකරුවෝ නඩුව ගොනු කරන අවස්ථාව වන විටත් ශ්‍රී ලංකාවේ රැඳවුම් භාරයේ පසු වූහ.

එක්සත් ජනපද විමර්ශනයට අදාළ සම්පූර්ණ තොරතුරු සහ සාක්ෂි FBI ආයතනය හෝ අධිකරණ දෙපාර්තමේන්තුව හෝ සතුව පවතී. රජය විසින් නැවත විමර්ශන ආරම්භ කර ඇති බැවින්, මේ තොරතුරුත්, සාක්ෂිත් ලබා ගැනීම සඳහා ඇමරිකානු රජයට අයදුම්පතක් ඉදිරිපත් කර තිබේද? ඒ සඳහා ලැබුණු පිළිතුර කුමක්ද? එසේ නැති නම්, රජය එය නොකිරීමට හේතුව කුමක්ද? මේ තොරතුරු - සාක්ෂි ශ්‍රී ලංකාවේ අධිකරණ බලධාරීන්ට ලබා දිය යුතුය.

**එක්සත් ජාතික පක්ෂය**

**2026 ජූනි 18**